**ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (අයි-මාර්ග) - 2021**

ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර අදියර -1 සඳහා 2014 නොවැම්බර් 05 දින එළැඹි අංක 3171 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම, අදියර -2සඳහා 2015 මැයි 28 දින එළඹි අංක 3221 එස්ආර්අයි සහ 3222 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම, අදියර -3සඳහා 2015 දෙසැම්බර් 11 දින එළඹි අංක 3325 එස්ආර්අයි සහ 3326 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම, අදියර -4 සඳහා 2017 දෙසැම්බර් 15 දින එළඹි අංක 3610 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම යන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සහ වැඩසටහනේ කාලය

වැඩසටහනේ ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීමය. මෙහි දිගුකාලීන බලපෑම වන්නේ ජාතික හා පළාත් මාර්ගවල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුම අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 117,780 කට සමාන එ.ජ.ඩො. මිලියන 906 ක් වන අතර ඉන් රු.මිලියන 104,000 කට සමාන එ.ජ.ඩො. මිලියන 800 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 13,780 ක් ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය. වැඩසටහනේ මූල්‍ය සැලසුම බහු අදියර මූල්‍ය පහසුකම යටතේ අදියර 06 කින් සමන්විත අතර ඒ අතුරින්, 2021 දෙසැම්බර් 31 දින වන විට එ.ජ.ඩො. මිලියන 557 ක් වූ වෙනම ණය ගිවිසුම් 04 ක් ණය ප්‍රදානකරු සමඟ විය. වැඩසටහන එහි කටයුතු 2014 ජූනි 01 දින ආරම්භ කරන ලද අතර 2024 සැප්තැම්බර් 30 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර වැඩසටහනේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතී වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම ඊට සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණවේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රීලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කි.මී. 2,090.39 ක දිගකින් යුත් ග්‍රාමීය හා ජාතික මාර්ග 541 ක් 2021 දෙසැම්බර් 31 දින වන විට අදාළ නියෝජිතායතන වෙත භාර දී තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත | නිශ්චය කළ නොහැක. | එක් එක් මාර්ගය සඳහා දරන ලද මුළු පිරිවැය දැන ගත හැකි වන්නේ කාර්යසාධනය පදනම් කරගත් නඩත්තු කාලය අවසන් කර අවසාන ගෙවීම් | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ට අනුකූලව වත්කම් හඳුනාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | 01 ට අනුකූලව එහි පිරිවැය වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | | සහතිකය ලැබීමෙන් පසුව පමණි. | |
| (ආ) | උපදේශන සේවා සහ සිවිල් වැඩ වියදම් සඳහා ප්‍රතිපාදන සැපයීම සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තිය සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නිශ්චය කළ නොහැක. | මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තිය ඉදිරි වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ හෙළිදරව් කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ට පටහැනිව, ආරවුල් 08 කට අදාළ ආරවුල් විනිශ්චය මණ්ඩලයේ තීරණ යටතේ කොන්ත්‍රාත්කරුවන්ට හිමි ගෙවීම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සපයා නොතිබුණි. මෙම ආරවුල් සඳහා මූලික පිරිවැය හිමිකම් පෑම රු. මිලියන 431.82 ක් වූ අතර අවසන් මුදල විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මිලියන 431.82 | ඉදිරි වර්ෂයේ සිට අපේක්ෂිත ආරවුල් විනිශ්චය මණ්ඩල තීරණ සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන හෝ හෙළිදරව් කිරීම් සිදු කිරීමට සටහන් කර ඇත. කෙසේ වෙතත්, DAB, බේරුම්කරණය හෝ සුහද බේරුම්කරණය අවසන් වන තුරු, කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු නිශ්චිත මුදල ඇතුළත් කිරීමට නොහැකි වනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ට අනුකූලව ප්‍රතිපාදන හෝ හෙළිදරව් කිරීම් කළ යුතුය. |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ අහෝසි කරන ලද කොන්ත්‍රාත් පැකේජවලින් ලැබිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අවිනිශ්චිත අයකර ගැනීම් ලෙස හෙළිදරව් කර තිබුණද, හෙළිදරව් කිරීමේදී එය රු. මිලියන 100 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මිලියන 100 | ඉදිරි වසරේ මූල්‍ය ප්‍රකාශනවල වැරදි නිවැරදි කිරීමට සටහන් කර ඇත. | සම්පූර්ණ මුදල හෙළිදරව් කිරීම සිදු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ට අනුකූලව ප්‍රතිපාදන ශේෂ 4 කට අදාළව රු. මිලියන 1,541.6 ක් වූ මුදල් නොවන ස්වභාවයේ ගනුදෙනු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදිව ඉදිරිපත් කර නොතිබුණි. | මිලියන 1,541.6 | ඉදිරි වසරේ මූල්‍ය ප්‍රකාශනවලින් මුදල් නොවන ස්වභාවයේ අයිතම වෙනම ඉදිරිපත් කිරීමට සටහන් කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ට අනුකූලව සකස් කළ යුතුය. |
| (ඊ) | දේපල, පිරියත හා උපකරණවල ශුද්ධ පොත් වටිනාකම අඩු වීම දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීමක් ලෙස ආයෝජන ක්‍රියාකාරකම් යටතේ පෙන්වා ඇත. කෙසේ වුවද වසර තුළ මිලදී ගැනීම රු. මිලියන 5.2 ක් විය. තවද, මාර්ග සංවර්ධන අධිකාරියට පවරා ඇති වත්කම්වල ශුද්ධ පොත් වටිනාකම වැඩි වීම මුදල් ප්‍රවාහ | මිලියන 5.2 | ඉදිරි වසරේ මූල්‍ය ප්‍රකාශනවල මෙම වර්ගීකරණ දෝෂය නිවැරදි කිරීමට සටහන් කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ට අනුකූලව සකස් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාශයේ වැරදි ලෙස ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් පිටතට ගලා යාමක් ලෙස පෙන්වා දී තිබුණි. | | | |
| (ඇ) | වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ විදේශ ණයවලින් වූ මුළු වියදම රු. මිලියන 9,570.57 ක් වුවද, එය මහා භාණ්ඩාගාරයේ සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පිළිවෙලින් රු. මිලියන 10,128.95ක් සහ රු. මිලියන 10,073.05ක් ලෙස ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශනවල සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අතර රු. මිලියන 502.48 ක වෙනසකට හේතු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මිලියන 502.48 | මහා භාණ්ඩාගාරයේ හෝ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර ඇති මුළු වියදම ERD විසර්ජන විස්තර සමඟ නිවැරදිව සංසන්දනය කළ නොහැක. | අදාළ පාර්ශ්ව සමඟ සාකච්ඡා කළ යුතු අතර වෙනස්කම් අවම කර ගත යුතුය. |

**2.2 රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

| අංකය | රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසිවල 14.6 උප වගන්තිය | කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතු අවම අතුරු ගෙවීම් සහතිකය පිළිගත් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 1.5 කි.කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ පැකේජ 22 ක් යටතේ අවශ්‍ය අවම සීමාවට වඩා අඩු අතුරු ගෙවීම් සහතික ඇගයීමට ලක් කළ අවස්ථා 62 ක් නිරීක්ෂණය විය. | කොවිඩ් වසංගතය සහ ද්‍රව්‍ය හිඟය වැනි අනපේක්ෂිත තත්වයන්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී කොන්ත්‍රාත්කරුවන්ගේ මුදල් ප්‍රවාහයට අහිතකර ලෙස බලපානු ලබයි. එබැවින්, සේවා යෝජකයා විසින් වගන්තිය ලිහිල් කිරීමට නිර්දේශ කර ඇත. | පිරිවැය, කාලය සහ කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය අනුග්‍රහය දැක්වීම අවම කිරීම සඳහා කොන්ත්‍රාත් කොන්දේසිවල දක්වා ඇති සීමාවන් පිළිපැදීම අවශ්‍ය වේ. |
| (ආ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල 4.2 උප වගන්තිය | කොන්ත්‍රාත්කරුවන් විසින් කාර්ය සාධන සුරැකුම්පත් ඔවුන්ගේ වියදමින් ලබා දිය යුතු වුවද, කොන්ත්‍රාත්කරුවන්ට හිමිකම් පෑමට හැකි වන පරිදි ප්‍රමාණ පත්‍රවල මූලික හා පොදු අයිතමයන් යටතේ වෙනම ගෙවීම් අයිතමයක් දක්වා ඇති බව නිරීක්ෂණය විය.ඒ අනුව, කොන්ත්‍රාත්කරුවන් විසින් ලබාගත් කාර්ය සාධන බැඳුම්කරවල පිරිවැය | කාර්යසාධන බැඳුම්කර සැපයීම සඳහා මෙම උපුටා දක්වන ලද අයිතමය ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුවලින් ප්‍රතිපූරණය කළ නොහැක. කෙසේ වුවද, උතුරු, නැගෙනහිර සහ අනෙකුත් ඉදිරියට එන කොන්ත්‍රාත්තුවලදී, මෙම අයිතම BOQ වෙතින් ඉවත් කරනු ලැබේ. | ලංසු ලියකියවිලි නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥ සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රතිපූරණය කිරීම සඳහා රු. මිලියන 556.38 ක අතිරේක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. තවද, එම මුදල කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීමට 2021 දෙසැම්බර් 31 දක්වා කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | කොන්ත්‍රාත්තුවේ පිරිවිතරවල 108.4 උප වගන්තිය. | වැඩසටහන අවසානයේදී ප්‍රධාන සහ ක්ෂේත්‍ර රසායනාගාරයේ රසායනාගාර උපකරණ සහ ගෘහ භාණ්ඩ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දිය යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දිනට එම අයිතම සඳහා එකවර රු.මිලියන 615.22 ක් වැඩසටහන මගින් ගෙවා ඇත. | ඉදිරියේදී RDA වෙත ගෘහ භාණ්ඩ, රසායනාගාරයක් සහ මිනුම් උපකරණ අවශ්‍ය නම් මෙම කොන්දේසි එම කොන්දේසියට ගැලපෙන පරිදි සකස් කරනු ලැබේ. තවද, මෙම අයිතම වසර 2-3 කට වඩා වැඩි කාලයක් භාවිතා කිරීමෙන් පසුව, කොන්ත්‍රාත්තුව අවසානයේ බොහෝ දුරට භාවිතයට ගත නොහැකි හෝ යල් පැන ගිය තත්ත්වයේ පවතී. | සාමාන්‍ය භාවිතයක් ලෙස, අදාළ වත්කම් සේවා යෝජකයා විසින් රඳවා ගනු ලැබේ. එම නිසා, මෙම වැඩසටහන යටතේ කොන්ත්‍රාත්තුවේ පිරිවැය, වෙනත් දායක අරමුදල් සහිත ව්‍යාපෘති විසින් පිරිනමනු ලබන අනෙකුත් කොන්ත්‍රාත් පැකේජවල පිරිවැය සමඟ සසඳන විට අඩු කිරීම අවශ්‍ය වේ. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| අංකය | සංරචකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ජාතික හා ග්‍රාමීය මාර්ගවල පුනරුත්ථාපන කටයුතු අවසන් කිරීම හා භාර දීම. | 2021 දෙසැම්බර් 16 දිනැති යාවත්කාලීන කරන ලද පහසුකම් පරිපාලන අත් පොතට අනුව, දකුණ, මධ්‍යම, සබරගමුව, වයඹ සහ උතුරු මැද පළාත්වල සහ බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ ජාතික මාර්ග කි.මී. 248 ක් සහ ග්‍රාමීය මාර්ග කි.මී. 3,108 ක මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු වැඩසටහනේ කාල සීමාව තුළ පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, 2021 දෙසැම්බර් 31 වන දිනට | සැලසුම් කළ දිග සම්පූර්ණ කිරීමට නොහැකි වීමට හේතු,<br>1. 2015, 2018, 2019 සහ 2020 දී කැබිනට් සංශෝධනය සහ රජයේ වෙනස්කම් හේතුවෙන් ප්‍රසම්පාදන කමිටු නැවත පිහිටුවීම වැනි PMU පාලනයෙන් ඔබ්බට ගිය හේතු නිසා ප්‍රසම්පාදන ප්‍රමාදයන්.<br>2. ගිවිසුම් අහෝසි කිරීම, කොවිඩ් 19 බලපෑම් සහ අධිකරණ වාරණ නියෝග.<br>3. රජයේ සංවර්ධන ප්‍රතිපත්තියේ ප්‍රමුඛතාවයේ | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වැඩසටහනේ කටයුතු ආරම්භ කර වසර 06 කට පසුව ජාතික මාර්ග 4 ක දිග කි.මී. 27.43 ක් සහ ග්‍රාමීය මාර්ග 537 ක දිග කි.මී. 2,062.96 ක් ප්‍රතිසංස්කරණය කිරීම පමණක් අවසන් කර අදාළ ආයතන වෙත භාර දී තිබුණි. | වෙනස්කම් හේතුවෙන් වැඩසටහන යටතේ දැනටමත් හඳුනාගෙන ඇති මාර්ගවල වෙනසක් සිදු විය. | |
| (ආ) | ජාතික මාර්ගවල මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු ප්‍රදානය කිරීම. | කොන්ත්‍රාත් පැකේජ 09 ක් යටතේ ජාතික මාර්ග කි.මී. 423.11 ක් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර තිබුණද, 2021 දෙසැම්බර් 31 වන විට කි.මී. 278.11 ක දිගක් ආවරණය වන කොන්ත්‍රාත් පැකේජ 06ක් පමණක් ප්‍රදානය කර තිබූ අතර කි.මී. 145 ක් ඇතුළත් ඉතිරි කොන්ත්‍රාත් පැකේජ 03 සඳහා ලංසු තැබීමේ ක්‍රියාවලිය පවා අවසන් කර නොතිබුණි. | නිසි පරිදි ලබා දී නොමැත. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | ජාතික මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීම. | මෑතකදී ප්‍රදානය කරන ලද RMC 06 සහ RMC 07 කොන්ත්‍රාත් පැකේජ හැර ප්‍රදානය කරන ලද මාර්ග කළමනාකරණ කොන්ත්‍රාත් (RMC) අතුරින්, RMC 01 කොන්ත්‍රාත් පැකේජය යටතේ ඇති කොන්ත්‍රාත් හතරම 2021 දෙසැම්බර් 31 වන විට අනෙකුත් කොන්ත්‍රාත්තුවලට සාපේක්ෂව සියයට 8.9 සිට සියයට 23.9 දක්වා අඩු ප්‍රගතියක් වාර්තා කර තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය, සිමෙන්ති, පිපිරුම් ද්‍රව්‍ය වැනි ද්‍රව්‍යවල හිඟතාවය, මෙම මාර්ග කොටසේ ස්ථාන තුනක නායයෑම් කිහිපයක් සිදු වීම සහ අයහපත් කාලගුණික බලපෑම මෙම කොන්ත්‍රාත්තුවල අඩු ප්‍රගතියක් ඇති කිරීමට හේතු විය. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඈ) | අහෝසි කරන ලද කොන්ත්‍රාත්තුවල ඉතිරි වැඩ අවසන් කිරීම. | අහෝසි කරන ලද කොන්ත්‍රාත්තු 04 ක ඉතිරි වැඩ කි.මී 100,000 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන හරහා අවසන් කිරීමට අත්සන් කරන ලද | මෙම ව්‍යාපෘතියේ බොහෝ කොන්ත්‍රාත්කරුවන් ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් පීඩාවට පත්ව ඇත. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | බේරුම්කරණ ගිවිසුමේ නියමයන් සහ කොන්දේසි අනුව, ගිවිසුම අත්සන් කළ දින සිට මාස 15 ක් ඇතුළත ඉතිරි වැඩ අවසන් කිරීමට එකඟ වී තිබුණි. ගිවිසුම අත්සන් කළ දින සිට 2022 ජනවාරි 31 දිනට මාස 18 ක් ගත වී තිබුණද, මෙම පැකේජවල සියයට 11 සිට 29 අතර ඉතා අඩු භෞතික ප්‍රගතියක් වාර්තා කර තිබුණි. | | |
| (ඉ) | අහෝසි කරන ලද කොන්ත්‍රාත්තුවල ඉතිරි වැඩ අවසන් කිරීම. | කොන්ත්‍රාත් අහෝසි කළ දින සිට වසර 03 කට ආසන්න කාලයක් ගතවී ඇතත්, අහෝසි කරන ලද කොන්ත්‍රාත් පැකේජ 12 න් G1 සහ KL 02 යන කොන්ත්‍රාත් පැකේජ 02 ක ඉතිරි වැඩ අවසන් කිරීමට වැඩසටහන විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නීතිමය කටයුතු අවසන් වූ පසු එම කොන්ත්‍රාත් පැකේජවල ඉතිරි වැඩ අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා සෑම උත්සාහයක්ම ගත යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අතහැර දමා තිබුණු කොන්ත්‍රාත් පැකේජ 12 න්, කොන්ත්‍රාත් පැකේජ 06 ක ඉතිරි වැඩ මෙම වැඩසටහන මගින් සිදු කිරීම සඳහා 2021 දෙසැම්බර් 31 දිනට නැවත පිරිනමා තිබුණු අතර නැවත ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්වල වටිනාකම මුල් කොන්ත්‍රාත් මිලට සාපේක්ෂව රු. මිලියන 4,808.8 කින් වැඩි කර තිබුණි. | කාලයත් සමඟ ද්‍රව්‍යවල මිල ඉහළ ගොස් ඇති බැවින් මෙම නව කොන්ත්‍රාත්තුවල ලංසු මිල මුල් කොන්ත්‍රාත්තුවලට වඩා වැඩි ය. කෙසේ වුවද, ලංසු මිල ගණන් අතර වෙනස සේවා යෝජකයාගේ හිමිකම් පෑම හරහා අහෝසි කරන ලද කොන්ත්‍රාත්තුවල කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීමට සිදු වේ. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව සහ අමතර පිරිවැයකින් තොරව ඉදිකිරීම් නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | කි.මී. 100,000 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන මඟින් අතහැර දැමූ කොන්ත්‍රාත් 04 ක ඉතිරි වැඩ කටයුතු එම අසාර්ථක කොන්ත්‍රාත්කරුගෙන්ම අවසන් කිරීමට ගිවිසුම් අත්සන් කර තිබුණු අතර මුල් කොන්ත්‍රාත් මිල හා සසඳන විට එවැනි කොන්ත්‍රාත්වල වටිනාකම රු. | එම කොන්ත්‍රාත්කරුට කි.මී 100,000 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ වැඩ දිගටම කරගෙන යාමට අවසර දීමට තීරණය කරන ලද්දේ කොන්ත්‍රාත්කරු අධිකරණ නඩු ඉල්ලා අස් කර ගැනීමට සහ IPC වලින් අයකර නොගත් අත්තිකාරම් ආපසු | තවදුරටත් ප්‍රමාදයකින් තොරව සහ අමතර පිරිවැයකින් තොරව ඉදිකිරීම් නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මිලියන 417.6 කින් වැඩි වී ඇති බව සමාලෝචනය කර ඇත. | ගෙවීමට එකඟ වී ඇති බැවිනි. | |
| (ඇ) | කි.මී. 100,000 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහනට ලබා දී ඇති කොන්ත්‍රාත් පැකේජවලට අදාළ කොන්ත්‍රාත්කරු සහ මාර්ග සංවර්ධන අධිකාරිය අතර ඇති ගිවිසුම්වලට අනුව, නව දර්ශක යටතේ මිල ඉහළ නැංවීම සහ කරන ලද වැඩ සඳහා මිල ගැලපීම් සඳහා සහතික කළ ගෙවීම් ප්‍රමාණයෙන්, කරන ලද වැඩ සඳහා ගෙවිය යුතු අනෙකුත් ගෙවීම් සහ අතුරු බිල්පත් වලින් අයකර නොගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් පියවීමට දෙපාර්ශවය විසින් එකඟ වී ඇත. කෙසේ වුවද, එම පැකේජවලට අදාළ 2021 දෙසැම්බර් 31 දිනට අයකර නොගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ප්‍රමාණය රු. මිලියන 963.26 ක් බව නිරීක්ෂණය විය. | කි.මී. 100,000 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන එම අත්තිකාරම් පියවීමට අපොහොසත් වී ඇති අතර අත්තිකාරම් ගෙවීම අඩු කිරීමට කොන්ත්‍රාත්කරු විසින් කරන ලද වැඩ ප්‍රමාණවත් නොවන බව දන්වා සිටින ලදී. | හිඟ මුදල් අය කර ගැනීමට වැඩසටහන විසින් වහාම පියවර ගත යුතුය. |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට නැවත ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් පැකේජ 06 කට අදාළව අයකර නොගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ප්‍රමාණය රු. මිලියන 1,453.09 කි. තවද, අහෝසි කරන ලද කොන්ත්‍රාත් පැකේජ 02 කට අදාළව රු. මිලියන 377.07 ක අයකර නොගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල වැඩසටහනට අමතර පිරිවැයක් විය හැකිය. | මෙම කොන්ත්‍රාත්තු සඳහා අත්තිකාරම් ඇපකර මුදල් කර ගැනීම වැළැක්වීම සඳහා කොන්ත්‍රාත්කරුවන් විසින් අධිකරණ වාරණ නියෝගයක් ලබා ලබාගෙන තිබේ. අධිකරණ නඩු විභාග වෙමින් පවතින අතර මාර්ග සංවර්ධන අධිකාරියට අත්තිකාරම් මුදල් අයකර ගැනීමට හැකි වන්නේ අධිකරණ කටයුතු අවසන් වූ පසුව පමණි. | හිඟ මුදල් අය කර ගැනීමට වැඩසටහන විසින් වහාම පියවර ගත යුතුය. |
| (ඉ) | 2021 දෙසැම්බර් 31 වන විට, ආරවුල් 43ක් ආරවුල් විනිශ්චය මණ්ඩල තීරණ (DAB) වෙත යොමු කර ඇති අතර, එයින්, DAB තීරණය කොන්ත්‍රාත්කරුට හිතකර බවට වූ ආරවුල්වල මූලික පිරිවැය හිමිකම් පෑම්වල එකතුව රු.මිලියන 1,698.73ක් විය. කෙසේ වුවද, G2 පැකේජය සඳහා රු. මිලියන 107.72 ක් හැර 2021 දෙසැම්බර් 31 දිනට වැඩසටහන විසින් මේ සම්බන්ධයෙන් ගෙවීම් සිදු කර නොතිබුණි. | i-Road හි අහෝසි කරන ලද කොන්ත්‍රාත්තු ඇත්නම් සහ අයකර නොගත් අත්තිකාරම් ගෙවීම් මගින් RDA වෙත වගවිය යුතු නම්, සාර්ථකව නිම කරන ලද කොන්ත්‍රාත්තු සඳහා අනුමත හිමිකම් කිසිවක් නිකුත් නොකිරීමට RDA විසින් තීරණය ගෙන ඇත. එම නිසා, මූලික පිරිවැය හිමිකම් මුදල රු. මිලියන 695.1 ක් කොන්ත්‍රාත්කරුවන්ට හිමිව තිබියදීත් ගෙවා නොතිබුණි. | කොන්ත්‍රාත්කරුවන් සමඟ ඇති වන ආරවුල් අවම කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 පරිබාහිර ගෙවීම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළදී ණය මුදලින් භාවිතයට නොගත් අරමුදල් මත ණයදෙන ආයතනයට රු. මිලියන 45.54 ක පොලී සහ කැපකරු ගාස්තු අනාර්ථික ලෙස ගෙවා තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත පොලී සහ කැපකරු ගාස්තු රු. මිලියන 1,516.79 ක් විය. | ව්‍යාපෘතියේ කාර්යසාධනය යහපත් නම් කැපවීම් ගාස්තුවල කාර්යසාධනය අවම කර ගත හැකි අතර ණය සඳහා වෙන් කර ඇති කැපවීම් ගාස්තු තුළ තබා ගත හැක. | අනවශ්‍ය පිරිවැය අවම කිරීමට කටයුතු කළ යුතුයි. |